# මහින්ද පෝරකයට යවමු ද

මේ ජනාධිපතිවරණය තවත් ජනාධිපතිවරණයක් නොවන බව දැනටමත් බොහෝ දෙනාට අවබෝධ වී ඇත. මේ ජනාධිපතිවරණය ප්‍රභාකරන්ගේ ලේ වෙනුවට මහින්ද රාජපක්‍ෂ මහතාගේ ලේ ඉල්ලන යුදෙව් චින්තනයෙහි ඇසට ඇසක් දතට දතක් යන්න මුල්කරගෙන පැවැත්තෙන එකකි. මහින්ද චින්තනය යුදෙව් චින්තනයට හාත්පසින් විරුද්ධ වූවකි. මහින්ද චින්තනය පිටුපස ඇත්තේ මිහිඳු චින්තනය ය. මිහිඳු චින්තනය මත පදනම් වූ මහින්ද චින්තනය තව තවත් වර්ධනය කරගත හැකි ය.

පසුගිය මැයි 18 වැනි දා නන්දිකඩාල් කලපුවේ දී මියගියේ ප්‍රභාකරන් පමණක් නො වේ. ඔහු සමග දෙමළ ත්‍රස්තවාදය ද, බටහිරයන් හා තවත් අය විසින් නිර්මාණය කෙරුණු දෙමළ ජාතියේ ඊනියා ස්වයංනිර්ණ අයිතිය, දෙමළ නිජභූමි හෙවත් දෙමල ඓතිහාසික වාසභූමි, ඊනියා උතුරු නැගෙනහිර ඒකාබද්ධ සංකල්පය ආදිය ද ඒදින මරු දුටුවේ ය. ඒ සමග බටහිරයෝ ද පරාජය වූහ. බටහිරයන් ශාරීරික ව ඇතැම්විට සටනේ නො සිටිය ද (කොටි ගුවන් යානා පැදවූයේ කවුද යන්න හා ඒ යානා පැමිණියේ කොහේ සිට ද යන්න තවමත් විසඳී නැත) ඔවුන් විසින් දෙන ලද ආයුධ බහලු (කන්ටේනර්) රනිල් - ප්‍රභාකරන් ඊනියා සටන් විරාම ගිවිසුම සමයේදීත් ආයුධ තොග ගණනින් ඉන් පෙරත් කොටින්ට ලැබී ඇති බව පැහැදිලි ය. අප කලින් ද කියා ඇති පරිදි පසුගිය හැටවසක පමණ කාලයෙහි බටහිර යටත්විජිතවාදීන්ට කස්ත්‍රෝ හා හෝ චින් මින්ගෙන් පසුව දරුණුම පරාජය අත්වී ඇත්තේ මහින්ද රාජපක්‍ෂගෙනි. බටහිරයන්ට තමන්ගේ පරාජයවත් සිංහලත්වයට එරෙහිව ඔවුන් යොදාගත් දෙමළ ත්‍රස්තවාදයේ පරාජයවත් විඳ දරාගත හැකි නො වේ. අද ඔවුහු මහින්ද රාජපක්‍ෂ මහතා පරාජයකිරීම සඳහා සිය උපරිම ශක්තිය යොදති. ඒ කුමන්ත්‍රණයක් නො වේ. බටහිරයන් පසුගිය සියවස් එකහමාරකට වැඩි කාලයක් තිස්සේ ක්‍රියාකරන්නේ එසේ ය. ප්‍රපංච තේරුම්ගත නොහැකි ඇතැමුන් ඒ සඳහා කුමන්ත්‍රණය යන වචනය යොදාගැනීමෙන් පෙනී යන්නේ ඔවුන්ගේ බුද්ධිමය බංකොළොත් බව ය. ඒ කෙසේ වෙතත් ජනාධිපතිවරණයට සරත් ෆොන්සේකා ඉදිරිපත් කෙළේ ඇයි ද යන්න විශ්ලේෂණය කළ යුතු ය.

ජ වි පෙරමුණට විජේවීර ජීවත්ව සිටි කාලයේදීවත් ඔහු ඉදිරිපත් කර වුවත් ජනාධිපතිවරණයකින් ජයග්‍රහණය කිරීමේ අවස්ථාවක් නොතිබූ බව සියලු දෙනාම පාහේ පිළිගන්නා කරුණකි. ටිල්වින්ට හෝ සෝමවංශට හෝ අනුර දිසානායකට හෝ සම්ම ජාතියේ ජනාධිපතිවරණයක් ජයග්‍රහණය කළ නො හැකි ය. ජ වි පෙ විජේවීර ජීවත්ව සිටි කාලයේදීත් ඊනියා පොදු අපේක්‍ෂකයන් සෙවී ය. අද ඔවුන්ට සරත්ලා දෙදෙනකු ම ලැබී ඇත. එහෙත් ජ වි පෙරමුණෙහි අපේක්‍ෂාවන් ඊනියා පොදු අපේක්‍ෂකයන් ලවා ඉටුකරවා  ගත නොහැකි බව ඔවුන්ට කිසිදා අවබෝධ නොවනු ඇත. ඔවුන් බලා සිටින්නේ සරත් ෆොන්සේකා මහතා සමග හෝ නැතිව හෝ හමුදාවේ කිහිප දෙනකු යොදාගෙන ඊනියා විප්ලවයක් කිරීමට නම් එය ද කිසිසේත් සාර්ථක නොවනු ඇත. ඒ ජා පක්‍ෂයට අද පවත්නා වාතාවරණය යටතේ ජනාධිපතිවරණයක් තබා ප්‍රාදේශීය සභාවක්වත් ජයග්‍රහණය කළ නො හැකි ය. මෙයින් අදහස් වන්නේ ජ වි පෙරමුණට ප්‍රාදේශීය සභාවක් ජයග්‍රහණය කළ හැකි බව නො වේ. මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමෙන් පසුව ජ වි පෙරමුණට විශ්වවිද්‍යාලවල ශාස්ත්‍ර පීඨ කිහිපයක හැරෙන්නට වෙනත් කිසිම ආයතනයක නිලවරණයකින් ජයග්‍රහණය කිරීමට නොහැකි වනු ඇත. විශ්වවිද්‍යාලවලින් ද ජ වි පෙරමුණේ දේශපාලනය වැඩිකල් නොගොසින් අතුගෑවී යන බවට අනුර දිසානායක වැන්නවුන් වග බලාගනු ඇත. අද ඒ ජා පක්‍ෂයට ජයග්‍රහණය කළ නොහැක්කේ ප්‍රධාන වශයෙන් ම ඔවුන් කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව කළ සටන්වලට විරුද්ධ වූ නිසා ය.

ඒ ජා ප නායකයෝ, එනම් රනිල්, රවි කරුණානායක, කිරිඇල්ල වැනි කිසිම ජාතිකත්වයක් නැත්තෝ මානුෂික සටන් මෙහෙයුම්වලට විරුද්ධ වූහ. මංගල ඒ ජා පක්‍ෂයේ නොවුව ද ඔහු ද වැටෙන්නේ මේ ගණයටම ය. ඔවුන්ට අඩුම තරමින් ඒ ජා පක්‍ෂයේ සේනානායකවරුන්ට, ප්‍රේමදාසලාට තිබූ ජාතිකත්වයද නො මැත. අලිමංකඩ යන්නේ යැයි කියමින් පාමංකඩ යන බවත්, කිලිනොච්චි යන්නේ යැයි කියමින් මැදවච්චි යන බවත්, තොප්පිගල යනු කැලෑවක් බවත්, ඕනෑම ගොනකුට යුද්ධ කිරීමට හැකි බවත්, සරත් ෆොන්සේකා ගැලවීමේ හමුදාවේ නායකත්වයටවත් නුසුදුසු බවත් කීවෝ ඔවුහු ය. අද සරත් ෆොන්සේකා ඒ ජා පක්‍ෂයේ ගැලවීමට යොදා හැනීම ම දෛවයේ සරදමකි.

© Prof. Nalin De Silva

අද මෙරට ජනතාවගෙන් සියයට අනුවකටත් වැඩි පිරිසක් කොටි පරාජය කිරීම අනුමත කරති. දෙමළ හා මුස්ලිම් ජනයා ද එයට අයත්වන බව ඔවුන්ගෙන් මහින්ද රාජපක්ෂ මහතාට ලැබෙන ප්‍රතිචාරයෙන් පිළිබිඹු වෙයි. සාමාන්‍ය භාෂාවෙන් කියන්නේ නම් ජනතාවගෙන් අති විශාල බහුතරය යුද්ධය අනුමත කරති. (යුද්ධය යන වචනය සංකල්පීය ව ගත්කල නිවැරදි නො වේ. එහෙත් මේ ලිපියෙහි සටන් මෙහෙයුම් යන්න වෙනුවට බොහෝ අවස්ථාවල යුද්ධය යන්න යොදා ගැනෙයි.) ඒ අනුමත නොකරන්නේ රනිල්ලා සම්බන්ධන්ලා වැනි පිරිසක් පමණ ය. දෙමළ එක්සත් සංධානයෙහි ද බහුතරය අද යුද්ධය අනුමත කරන බව පැහැදිලි ය. රට එවැනි තත්වයකට ගෙන ඒම එක රැයකින් සිදුවූවක් නො වේ. එකල යුද්ධයට පක්ෂපාතිවූවවෝ යුදවාදීන් ලෙස හඳුන්වනු ලැබූහ. භික්ෂූන් වහන්සේ බුද්ධපුත්‍රයන් නොව යුද්ධපුත්‍රයන් ලෙස හැඳින්වූ බෞද්ධ මහෝපාසකයෝ වූහ. රාජ්‍ය නොවන බැළයෝ තායිලන්තයෙන් ද ඊනියා බෞද්ධ පඬිවරු ගෙන්වා ඔවුන් ලවා බෞද්ධයන්ට යුද්ධය අකැප යැයි කියවූහ. තම්බයියා නම් දෙමළ ක්‍රිස්තියානි මහාචාර්යවරයෙක් බුද්ධාගම පාවාදීම නමින් කෘතියක් පළ කෙළේ ය. එහෙත් ඒ සියලු මතවාද පරාජය කිරීමට ජාතික ව්‍යාපාරයට හැකි විය.  එදා යුද්ධයට විරුද්ධවූවෝ අද යුද්ධයට පක්ෂ වෙති. රනිල් වැන්නන්ට පවා අද යුද්ධයට විරුද්ධව කතා කළ හැකි නො වේ.

මේ හේතුවෙන් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වී ජයග්‍රහණයක් ගැන බලාපොරොත්තු තැබීමට පවා අද යුද්ධයට සම්බන්ධ වූවකු ඉදිරිපත් කළයුතු ව ඇත. රනිල් වැන්නන්ට ජනාධිපතිවරණයට ඉදිරිපත්විය නොහැක්කේ එබැවිනි. පසුගිය පළාත්සභා ඡන්දවලදී එ ජ නි ස ඉතා විශාල වැඩි ඡන්දවලින් ජයගග්‍රහණය කෙළේ එ ජා ප නායකත්වය යුද්ධය සම්බන්ධයෙන් කළ කී දෑ පිළිබඳ ව මහජනයාගේ අප්‍රසාදය ඔවුන් වෙත යොමු වී ඇති බැවින් හා යුද්ධයේ නායකත්වය දැරූ මහින්ද රාජපක්ෂ මහතාට විශාල ප්‍රසාදයක් හා ගෞරවයක් හිමිව තිබූ හෙයිනි. එ ජා පක්ෂයට ජ වි පෙරමුණට හා මංගලට ජනාධිපති අපේක්ෂකයකු ඉදිරිපත්කර දිනන්නට බලාපොරොත්තු තබාගත නොහැකි බැවින් ඔවුහු ඊනියා නිර්පාක්ෂික අපේක්ෂකයකු සෙවූහ. නිර්පාක්ෂික අපේක්ෂකයන් නැතිවුවත් ඔවුහු එවැන්නකු ගැන ජනතාවට කීවෝ ය. ඒ ඊනියා නිර්පාක්ෂික අපේක්ෂකයා යුද්ධයට සම්බන්ධ වූවකු වීම ද අනිවාර්ය විය. හිටපු විනිසුරු සරත් සිල්වාට වඩා හිටපු හමුදාපති සරත් ෆොන්සේකා එහි දී වැදගත් විය.

සරත් ෆොන්සේකා තෝරාගැනීමට තවත් ප්‍රධාන හේතුවක් විය. ඒ අප ගිය සතියේ කී ආකාරයට ඔහු ඇමරිකන් උසාවියක රජයේ සාක්ෂිකරුවකු වී සිටීම ය. ඔහු ලවා අද කරවාගත නොහැකි දෙයක් නැත. තම ගැලවීම සඳහා ඔහු විජාතික බලවේගවලට අවශ්‍ය දෑ මැනවින් ඉටුකරයි. මහින්ද රාජපක්ෂ මහතා, ගෝඨාභය රාජපක්ෂමහතා, ශවින්ද්‍ර සිල්වා, ප්‍රසන්නසිල්වා වැනි හමුදා නිලධාරීන් යටත්විජිතවාදීන්ගේ  දංගෙඩියට යැවීමට ඔහු ඊනියා සුදුකොඩි සෙල්ලමේ සිට වෙනත් ඕනෑම දෙයක් දක්වා කීමට සූදානම් ව සිටියි. යුද්ධය ජයග්‍රහණය කෙළේ සරත් ෆොන්ස්කාගේ නායකත්වයෙන් යැයි කීමට එ ජා පය ද පෙරට පැමිණ සිටී. යුද්ධයට පරිභව කළ එ ජා පයට යුද්ධයේ ජයග්‍රහණය වෙනුවෙන් කතාකිරීමට කිසිම අයිතියක් නැති වුවත් ලජ්ජා නැති කම මහමුදලි කමටත් වැඩි  නිසා එ ජා පය සරත් ෆොන්සේකාට යුද්ධය පිළිබඳ සියළු ගෞරව ලබාදීමට උත්සාහ කරයි. යුද්ධය දිනුවේ කවුද යන්න කතාකළ යුතු ප්‍රශ්නයක් නො වේ. රුවන්වැලිසෑය නිර්මාණය කෙළේ ගැමුණු රජතුමා යැයි අප කියන්නේ එතුමන් එහි ගඩොල් ඇල්ලීමට ගිය නිසා නො වේ. එයට නායකත්වය සැපයුයේ එතුමා ය. බොහෝ දෙනා තමන් තැනූ ගෙවල් ගැන කතාකරන්නේ එහි මේසන් වැඩ හෝ කළ නිසා නොව තම තමන්ගේ නායකත්වයෙන් ඒ ඉදි කෙරුණු බැවිනි.

මුළු යුද්ධය ම කෙරුණේ මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන නායකත්වයෙනි. යුද්ධය නැවැත්වීම සඳහා බටහිරයන් බලපෑම් කෙළේ ඒ මහතාට මිස සරත් ෆොන්සේකාට නො වේ. යුද්ධයට අවශ්‍ය අවි ආයුධ (කිසිම බර ආයුධයක් මේ ආණ්ඩුවෙන් නොලැබුණු බව සරත් ෆොන්සේකා කියන විට ඔහු කියන අනෙක් දෑ ද සත්‍යයෙන් තොර බව වැටහෙයි.) ලැබුණේ ගෝඨභය රාජපක්ෂ මහතාගේ මැදිහත්වීමෙනි. අද අපට තීරණය කිරීමට ඇත්තේ ඇමරිකාවේ රජයේ සාක්ෂිකරුවකු වූ සරත් ෆොන්සේකාගේ ලජ්ජා නැති සත්‍යයෙන් තොර බසට රැවටී මහින්ද රාජපක්ෂ මහතා යටත්විජිතවාදීන්ගේ දංගෙඩියට දක්කා මියගිය සංකල්පවලට පණ දී නැවතත් දෙමල ත්‍රස්තවාදය ඇතිකර දෙවැනි ප්‍රභාකරන් කෙනකු බිහිකර මෙරට නැවතත් ලේ විලක් කරන්නේ ද නැත්ද යන්න ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva